මාධ්‍ය නිවේදන අංක 01

# මාධ්‍ය නිවේදනයයි

2017.11.01 වන දින පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාවරයා විසින් පළාත් පාලන ආයතන සහික සංඛ්‍යාව දැක්වෙන ගැසට් නිවේදනය නිකුත් කර ඇති බව දන්වා ඇති හෙයින්, එකී ඡන්ද විමසීම පැවැත්වීම ප්‍රමාදවීමට හේතු වූ බාධා ඉවත් වී ඇති බැවින් 2017 නොවැම්බර් 01 දින මැතිවරණ මහලේකම් කාර්යාලයේ දී රැස් වූ මැතිවරණ කොමිෂන් සභාව පහත සඳහන් තීරණ වලට එළඹිණි.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ 26 වන වගන්තිය යටතේ තේරීම්භාර නිලධාරීන් විසින් නිකුත් කළයුතු නාමයෝජනා කාලසීමාව පිළිබඳ දැන්වීම හෙවත් නාමයෝජනා කැඳවීමේ දැන්වීම 2017.11.27 දිනයෙන් ආරම්භ වන සතිය තුළ දී නිකුත් කිරීමට උපදෙස් දීමට තීරණය කරන ලදි. එම නිශ්චිත දිනය පසුව නිවේදනය කෙරේ. ඒ අනුව නාමයෝජනා කාලසීමාව, එම දැන්වීම නිකුත් කරන දිනයට පසුව එළඹෙන දාහතරවන වන දිනයෙන් ආරම්භ වී දාහත්වන වන දින මධ්‍යාහ්න 12.00 ට අවසන් වීමට නියමිත ය. **නාමයෝජනා කාල සීමාව දින 3 ½ පමණක් වන අතර එම කාල සීමාව** 2017.12.11 සිට 2017.12.20 අතර වනු ඇතැයි අපේක්ෂිතය.

ඡන්ද විමසීම් දිනය නිල වශයෙන් ප්‍රකාශයට පත්කෙරෙන්නේ, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ 38 වන වගන්තිය යටතේ නාමයෝජනා කාලසීමාව හා එයට අදාළ කටයුතු නිමවීමෙන් අනතුරුව තේරීම්භාර නිලධාරීන් විසින් නිකුත් කරනු ලබන ඡන්ද විමසීම් පිළිබඳ ගැසට් නිවේදනය මගිනි. එකී නිවේදනය නිකුත් කරන දිනයේ සිට සති පහකට නො අඩු සහ සති හතකට නො වැඩි කාලසීමාව ඇතුළත ඡන්ද විමසීම පැවැත්විය යුතුය. ඒ අනුව ඡන්ද විමසීම 2018 ජනවාරි 20 දින සිට ජනවාරි 31 අතරතුර ඉරිදා දිනයක් හෝ රජයේ නිවාඩු දිනයක් නො වන දිනයක දී පැවැත්වෙනු ඇත.

ඉහත නාමයෝජනා පිළිබඳ දැන්වීම පළකරනු ලබන දිනය, නාමයෝජනා කාලසීමාව සහ ඡන්ද විමසීම පැවැත්වෙන දිනය නිශ්චිත වශයෙන් නම් කිරීම ඉදිරි දිනවල දී පවත්වනු ලබන මැතිවරණ කොමිසම් රැස්වීම්වලදී තීරණය කරනු ලැබෙනු ඇත.

මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙන්

**මහින්ද දේශප්‍රිය**
**සභාපති**
**මැතිවරණ කොමිෂන් සභාව**

2017.11.01 වන දින මැතිවරණ මහලේකම් කාර්යාලයේදීය.